NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

**ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය**

**10 ශ්‍රේණිය** | **නර්තනය** | **ඒකකය : 10**

# සොකරි ගැමි නාටකය

- **ප්‍රශ්න අංක 01 සිට 21 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ශ්‍රී ලංකාවේ ප්‍රචලිත ගැමි නාටක මොනවා ද?
1) සොකරි, කෝලම්, නාඩගම් 2) සොකරි, කෝලම්, නූර්ති
3) සොකරි, නාඩගම්, නූර්ති 4) නාඩගම්, නූර්ති, රූකඩ

02) සොකරි යනුවෙන් හඳුන්වන්නේ,
1) උඩරට සාම්ප්‍රදායික ගැමි නැටුමකි. 2) උඩරට සාම්ප්‍රදායික ජන නැටුමකි.
3) උඩරට සාම්ප්‍රදායික ගැමි නාටකයකි. 4) උඩරට සහ සබරගමු ජන නැටුමකි.

03) සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයක් වන්නේ කුමක් ද?
1) හඟුරන්කෙත 2) පොකුණුවිට 3) මිරිස්ස 4) බෙන්තර

04) සොකරි ගැමි නාටකය ප්‍රචලිත ප්‍රදේශයක් නොවන්නේ කුමක් ද?
1) හඟුරන්කෙත 2) මාතලේ කළුන්දෑව
3) ඔලබොඩුව 4) කොනකලගල

05) සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශයක් යැයි නොසැලකෙන්නේ,
1) මාතලේ 2) බෙන්තර 3) මහනුවර 4) වන්නිය

06) සොකරි නාටකයේ දී හමුවන චරිතයක් නොවන්නේ,
1) ගුරුහාමි 2) පරයා 3) සොත්තානා 4) නොන්චි

07) පරයා, සොත්තානා වැනි චරිත හමුවන්නේ කුමන ගැමි නාටකයේ ද?
1) නාඩගම් 2) කෝලම් 3) නූර්ති 4) සොකරි

08) ගුරුහාමි, වෙදරාළ යන චරිත ඇතුළත් ගැමි නාටක විශේෂය කුමක් ද?
1) රූකඩ 2) සොකරි 3) කෝලම් 4) නාඩගම්

09) සොකරි ගැමි නාටකය සඳහා භාවිත රංග භූමිය කුමක් ද?
1) කරළිය 2) තානායම්පොළ
3) කමත 4) රංග මණ්ඩපය

10) සොකරි රඟ මඩල,
1) ත්‍රිකෝණාකාරය. 2) කවාකාර ය.
3) හතරැස් ය. 4) සෘජුකෝණාස්‍රාකාර ය.

11) බදුල්ල දිස්ත්‍රික්කයේ සොකරි නාටකය සඳහා යොදා ගනු ලබන ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වනුයේ කුමක් ද?
1) ගැටබෙරය 2) දවුල 3) උඩැක්කිය 4) දික් බෙරය



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

12) සොකරි නාටකය සඳහා ගැටබෙරය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස යොදාගනු ලබන්නේ කුමන දිස්ත්‍රික්කවල ද?
1) මහනුවර, මාතලේ, කුරුණෑගල 2) බදුල්ල, මොණරාගල, මහනුවර
3) අනුරාධපුරය, පුත්තලම, බදුල්ල 4) මහනුවර, කුරුණෑගල, බදුල්ල

13) සොකරි නාටකයේ එන චරිත දෙකකි.
1) සොකරි, ගුරුහාමි 2) ආඬිගුරු, ගුරුහාමි
3) පරයා, පච්චමීරා 4) සොත්තානා, සොක්කා

14) සොකරි රඟ දැක්වීමේ දී වෙස් මුහුණු නොපළඳින චරිතයක් වන්නේ,
1) වෙදරාළ 2) සොත්තානා 3) ගුරුහාමි 4) පරයා

15) සොකරි රංගනයට අයත් ප්‍රධාන චරිත ලෙස හැඳින්විය හැක්කේ,
1) සොකරි, ගුරුහාමි, පරයා, වෙදරාළ 2) සොකරි, පච්චමීරා, සොත්තානා, කාලි
3) සොකරි, සොක්කා, හෙට්ටියා, වඩුරාළ 4) සොකරි, ආඬිගුරු, පරයා, පුලවරු

16) සොකරි නාටකයට අයත් අතුරු චරිත කිහිපයක් ලෙස හැඳින්විය හැක්කේ,
1) සොකරි, ගුරුහාමි, පරයා, වෙදරාළ, 2) සොකරි, පරයා, වෙදරාළ, කාලි
3) වඩුරාළ, හෙට්ටියා, සොත්තානා, කාලි 4) වෙදරාළ, වඩුරාළ, ගුරුහාමි, කාලි

17) සොකරි නාටකය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
1) ගැහැණු චරිත, ගැහැණු - පිරිමි දෙපාර්ශවයම රඟපාති.
2) සමහර චරිත සඳහා වෙස් මුහුණු පළඳී.
3) සාමාන්‍ය ජීවිතයේදී භාවිත රංග වස්ත්‍රාභරණ යොදාගනී.
4) සරල තාලවලින් යුත් බෙර පද යොදා ගැනේ.

18) සොකරි නාටකය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
1) රංග භූමිය ලෙස කමත යොදා ගැනේ.
2) ගමට, රටට සෙත් ශාන්තියක් උදා කර ගැනීම නාටකය පැවැත්වීමේ එක් අරමුණකි.
3) ශ්‍රී ලංකාවේ දකුණු පළාත්වල ප්‍රචලිත ය.
4) ප්‍රධාන ගායකයකු හා අත්වැල් ගායකයන් සහභාගී වේ.

19) ''වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ'' මෙහි මීළඟ පදය කුමක් ද?
1) විදා පාන්නේ අත්දෙක තැගි කියන්නේ,
2) කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
3) යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
4) මුදා හරින්නේ හනිකට ගමරට යන්නේ

20) සොකරි නාටකය පුරාවටම දක්නට ලැබෙන බෙර පදය වනුයේ කුමක් ද?
1) දොං ජිංත ගත දොංත 2) දොං ජිජි ගත
3) කුද ගත ගත දොං 4) දොදොංත තකුදොං

21) සොකරි නාටකයේ දී රඹුක් ලීයක් අතෙහි දරාගෙන රංගනයේ යෙදෙන්නේ කවුද?
1) ගුරුහාමි 2) සොකරි 3) පරයා 4) වෙදරාළ



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

- **නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

22) කමත රංග භූමිය ලෙස යොදා ගන්නේ .................................... නාටකයේ දී ය.

23) වන්නි හත්පත්තුවේ සොකරි නාටකය රඟදැක්වීමේ දී ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස .................................... භාවිත කිරීම ප්‍රාදේශීය අනන්‍යතාවයකි.

24) මහනුවර ප්‍රදේශයේ සොකරි නාටකය රඟ දැක්වීමේ දී වාද්‍ය භාණ්ඩ ලෙස .................................... භාවිත කෙරේ.

25) සොකරි නාටකයේ දී මාත්‍රා .................................... තාල රූපයට අයත් බෙර පද භාවිත වේ.

26) ''අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී'' යනුවෙන් සොකරි නාටකයේ දී හඳුන්වා දෙන්නේ .................................... ගේ චරිතයයි.

27) සශ්‍රීකත්වය පදනම් කරගෙන උඩරට වන්නි පළාත්වල .................................... නාටකය රඟ දැක්වේ.

28) ''ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ'' යනු .................................... නාටකයේ .................................... නමැති චරිතය හඳුන්වාදෙන කවියක මුල් පදයයි.

29) කොළපත් යොදාගෙන වෙස් මුහුණු නිර්මාණය කරනු ලබන්නේ .................................... නාටකයේදී ය.

30) සොකරි නාටකය පවත්වනු ලබනනේ .................................... දේව ඇදහීම මුල් කරගෙන ය.

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

31) දේශීය ගැමි නාටක 03 ක් නම් කරන්න.

32) සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශ 04 ක් නම් කරන්න.

33) සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු 03 ක් දක්වන්න.

34) සොකරි නාටකයට පසුබිම් වූ කතා පුවත කෙටියෙන් දක්වන්න.

35) සොකරි නාටකයට අයත් කවි දෙකක් ලියන්න.

36) සොකරි නාට්‍යයෙහි රංග වස්ත්‍රාභරණ හා චරිත නිරූපණය පිළිබඳ කෙටියෙන් සඳහන් කරන්න.

37) සොකරි නාටකය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

38) සොකරි නාටකයේ භාවිත කරන රංග භාණ්ඩ 03 ක් නම් කරන්න.

39) සොකරි නාටකයේ දී සරල වෙස් මුහුණු සාදාගන්නා අමුද්‍රව්‍ය 03 ක් ලියන්න.

40) සොකරි නාටකයේ අදහන ලබන දෙවිවරුන් තිදෙනෙක් නම් කරන්න.

41) මෙහි දක්නට ලැබෙන අනුරූපණ අවස්ථා 03ක් සඳහන් කරන්න.

42) මෙහි රංග ශෛලිය පිළිබඳ කරුණු 03 ක් ලියන්න.

43) මෙය රැක ගැනීමට යෝජනා 03 ක් ඉදිරිපත් කරන්න.

44) මෙහි රංග භූමි ආකෘතිය ඇඳ නම් කරන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!